ඉන්දීය රංගන ශිල්පී සුෂාන්ත සින්ග් මියගිය පුවත බොහෝ මාධ්‍ය ඔස්සේ ආවරණය වී තිබිණි. මෙහිදී අපට නිරීක්ෂණය කළ හැකි වූයේ ගාඩියන් වැනි මාධ්‍ය මගින් මෙම සිදුවීම වාර්තා කිරීමේදී දිවි අහිමි කර ගැනීම් සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු නිවැරදි මාධ්‍ය ආචාර ධර්ම අනුගමනය කොට තිබූ ආකාරයයි.

දිවි අහිමි කර ගැනීම් වාර්තා කිරීමේදී ඊට අදාළව පවතින ආචාර ධර්ම අනුගමනය කිරීම වැදගත් වන්නේ, ආචාර ධාර්මික නොවන, වගකීම් සහගත නොවන ලෙසකින් දිවි අහිමි කර ගැනීම් වාර්තා කිරීම ඔස්සේ වක්‍රාකාරයෙන් තවත් දිවි අහිමි කරගැනීම් වෙත පෙළැඹවීම් ඇති කිරීමේ හැකියාවක් පවතින බව පර්යේෂකයින් පවසන නිසාවෙනි. විශේෂයෙන්ම සුෂාන්ත් සින්ග් වැනි රංගන ශිල්පියෙකුගේ දිවියෙන් සමුගැනීම වාර්තා කරනා අයුර ඔස්සේ, එවන් වූ උත්ප්‍රේරණයක් ඇතිවීමට වැඩි නැඹුරුතාවයක් තිබෙනවා විය නොහැකිද?

එනිසාම දිවි අහිමි කරගත් පුවත ප්‍රමුඛතාවයකින් යුතුව වාර්තා නොකිරීම, දිවි අහිමි කරගත් ආකාරය සඳහන් නොකිරීම මෙන්ම උපකාරක අංක සඳහන් කිරීම, දිවි අහිමි කර ගැනීම් සම්බන්ධයෙන් ආචාර ධාර්මික වාර්තාකරණයකට අත්‍යාවශ්‍ය බව මෙසේ සිහිපත් කරමු.
මූලාශ්‍ර: http://www.who.int/mental_health/suicide-prevention/resource_booklet_2017/en/

මෙවැනි අවස්ථාවකදී 1333-CCCline හෝ 0112696666-ශ්‍රී ලංකා සුමිත්‍රයෝ සහ ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 යන හදිසි උපකාර අංකයන් ඇමතීම ඔස්සේ අවශ්‍ය උපකාර ලබාගැනීමට ඔබට හැකියාව තිබේ.
#MediaEthics #lka #SinhalaPress #EnglishPress #Divaina #Aruna #Mawbima #CeylonToday